# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| දිනය Date | 2026.06.15 පැය 0545 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/969 /2026 |
| විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk | | | | |

<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු.</u>

***பொலிஸ் ஊடகப் பிரிவுக்கு கிடைத்த முக்கிய தகவல்கள்***

**01. තීරුබදු නොගෙවා විදෙස් රටකින් ආනයනය කරන ලද භාණ්ඩ සහිත කන්ටේනර් රථයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කුලියාපිටිය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2026.06.14 දින දහවල් නාරම්මල පොලිස් වසමේ හොරොම්බාව ප්‍රදේශයේදී කුලියාපිටිය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත **තීරුබදු නොගෙවා විදෙස් රටකින් ගෙන්වන ලද භාණ්ඩ සහ අමතර කොටස් සහිත කන්ටේනර් රථයක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කුලියාපිටිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු අවුරුදු 41 ක් වන හොරොම්බාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

විදෙස් රටක නිෂ්පාදිත මත්පැන් බෝතල් 190 ක්, යතුරුපැදි කොටස්, යතුරුපැදි වැසි 42 ක්, යතුරුපැදි එංජින් 44 ක්, පාපැදි/පාපැදි කොටස්, ෆෝක් ලිෆ්ට් 06 ක්, ස්කැවේටර් යන්ත්‍ර 03 ක්, කෘෂි උපකරණ හා ගෘහ භාණ්ඩ රැසක් මෙම කන්ටේනර් රථයේ තිබී පොලිස් භාරයට ගෙන ඇත.

මෙම කන්ටේනර් රථය පරීක්ෂා කිරීම සඳහා කුලියාපිටිය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන්ගේ සහයට කුරුණෑගල හා පුත්තලම පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරුවලට අනුයුක්ත සෝදිසි නිලධාරීන්ද කැඳවා ඇත. කුලියාපිටිය පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

***தீர்வை வரி செலுத்தாமல் வெளிநாட்டில் இருந்து இறக்குமதி செய்யப்பட்ட பொருட்களுடன் கன்டெய்னர் வாகனம் கைப்பற்றப்பட்டது – குளியாப்பிட்டிய பிரிவு குற்றவியல் விசாரணைப் பணியகம்.***

*2026.06.14 நண்பகல், நாரம்மல பொலிஸ் பிரிவுக்குட்பட்ட ஹொரொம்பாவ பகுதியில், குளியாப்பிட்டிய பிரிவு குற்றவியல் விசாரணைப் பணியக அதிகாரிகள் பெற்ற தகவலின் அடிப்படையில் மேற்கொண்ட நடவடிக்கையில், சுங்கவரி செலுத்தாமல் வெளிநாட்டிலிருந்து இறக்குமதி செய்யப்பட்ட*

பொருட்கள் மற்றும் உதிரிப்பாகங்களுடன் இருந்த கன்டெய்னர் வாகனமொன்றும், அதனுடன் தொடர்புடைய சந்தேகநபரும் கைது செய்யப்பட்டு குளியாப்பிட்டிய பொலிஸ் நிலையத்திற்கு ஒப்படைக்கப்பட்டனர்.

கைது செய்யப்பட்டவர் 41 வயதுடைய ஹொரொம்பாவ பகுதியைச் சேர்ந்தவர்.

கன்டெய்னரில் இருந்து 190 வெளிநாட்டு மதுபான போத்தல்கள், மோட்டார் சைக்கிள் உதிரிப்பாகங்கள், 42 மோட்டார் சைக்கிள் சேஸிகள், 44 மோட்டார் சைக்கிள் இயந்திரங்கள், மிதிவண்டிகள் மற்றும் அவற்றின் உதிரிப்பாகங்கள், 06 போர்க்லிப்ட் இயந்திரங்கள், 03 அகழ்வாராய்ச்சி (Excavator) இயந்திரங்கள், விவசாய உபகரணங்கள் மற்றும் பல வீட்டு உபயோகப் பொருட்கள் பொலிஸாரால் கைப்பற்றப்பட்டுள்ளன.

மேலும், கன்டெய்னரை முழுமையாகச் சோதனை செய்வதற்காக குருநாகல் மற்றும் புத்தளம் பொலிஸ் விசேட அதிரடிப்படையின் மோப்ப நாய் பிரிவு அதிகாரிகளும் அழைக்கப்பட்டுள்ளனர்.

## 02. දියේ ගිලී පුද්ගලයෙකු මියයාම - අළුත්ගම පොලිස් වසම.

2026.06.14 දින සවස අළුත්ගම පොලිස් වසමේ මොරගල්ල ප්‍රදේශයේ මුහුදු වෙරළ ආසන්නයේදී පුද්ගලයෙකු දියේ ගිලී මියගොස් ඇති බවට අළුත්ගම පොලිස් ස්ථානයට ලද පණිවුඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු අවුරුදු 45 ක් වූ ඇහැලියගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම මියගිය අය තම මිතුරන් සමඟ දිය නාමින් සිටියදී මෙසේ දියේ ගිලී මියගොස් ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයෙදී අනාවරණය වී ඇත. අළුත්ගම පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### நீரில் மூழ்கி ஒருவர் உயிரிழப்பு – அளுத்கம பொலிஸ் பிரிவு

2026.06.14 மாலை, அளுத்கம பொலிஸ் பிரிவுக்குட்பட்ட மொரகல்ல கடற்கரைப் பகுதியில் ஒருவர் நீரில் மூழ்கி உயிரிழந்துள்ளதாக கிடைத்த தகவலின் அடிப்படையில் விசாரணைகள் ஆரம்பிக்கப்பட்டுள்ளன.

உயிரிழந்தவர் 45 வயதுடைய எஹலியகொட பகுதியைச் சேர்ந்தவர் ஆவார்.

இவர் தனது நண்பர்களுடன் கடலில் நீராடிக் கொண்டிருந்தபோது நீரில் மூழ்கி உயிரிழந்துள்ளதாக ஆரம்பகட்ட விசாரணைகளில் தெரியவந்துள்ளது.

## 03. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වලාන මධ්‍යම දූෂණ මර්ධන ප්‍රහාරක ඒකකය.

2026.06.14 දින අළුයම මිනුවන්ගොඩ පොලිස් වසමේ ගමන්ගෙදර ප්‍රදේශයේදී වලාන මධ්‍යම දූෂණ මර්ධන ප්‍රහාරක ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින්

වැටලීමක් සිදුකර **නීති විරෝධි මත්පැන් ලීටර් 150 ක් (බෝතල් 200) සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මිනුවන්ගොඩ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු අවුරුදු 54 ක් වන ගමන්ගෙදර, මිනුවන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මිනුවන්ගොඩ පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

***சட்டவிரோத மதுபானங்களுடன் ஒருவர் கைது – வலான மத்திய ஊழல் ஒழிப்பு பிரிவு***

*2026.06.14 அதிகாலை, மினுவாங்கொட பொலிஸ் பிரிவுக்குட்பட்ட கமன்கெதர பகுதியில், வலான மத்திய ஊழல் ஒழிப்பு பிரிவு அதிகாரிகள் மேற்கொண்ட சோதனையில் 150 லீற்றர் (200 போத்தல்கள்) சட்டவிரோத மதுபானங்களுடன் ஒருவர் கைது செய்யப்பட்டு மினுவாங்கொட பொலிஸ் நிலையத்திற்கு ஒப்படைக்கப்பட்டுள்ளார்.*

*கைது செய்யப்பட்டவர் 54 வயதுடைய கமன்கெதர, மினுவாங்கொட பகுதியைச் சேர்ந்தவர்.*

**04. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - දංකොටුව පොලිස් ස්ථානය.**

2026.06.14 දින උදෑසන දංකොටුව පොලිස් වසමේ කැරන්වත්ත ප්‍රදේශයේදී දංකොටුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 67.5 ක් (බෝතල් 90) සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු අවුරුදු 44 ක් වන යෝගියාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දංකොටුව පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

***சட்டவிரோத மதுபானங்களுடன் ஒருவர் கைது – தங்கொட்டுவ பொலிஸ் நிலையம்.***

*2026.06.14 காலை, தங்கொட்டுவ பொலிஸ் பிரிவுக்குட்பட்ட கெரன்வத்த பகுதியில் மேற்கொள்ளப்பட்ட சோதனையில், 67.5 லீற்றர் (90 போத்தல்கள்) சட்டவிரோத மதுபானங்களுடன் ஒருவர் கைது செய்யப்பட்டுள்ளார்.*

*கைது செய்யப்பட்டவர் 44 வயதுடைய யோகியான பகுதியைச் சேர்ந்தவர்.*

**05. ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - හලාවත කොට්ඨාස විෂ මත්ද්‍රව්‍ය අංශය.**

2026.06.14 දින දහවල් දංකොටුව පොලිස් වසමේ මැද ගෝනවිල ප්‍රදේශයේදී හලාවත කොට්ඨාස විෂ මත්ද්‍රව්‍ය අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 1215 ක් (බැරල් 06) සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන දංකොටුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු අවුරුදු 46 ක් වන මැද ගෝනවිල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දංකොටුව පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**

***கோடாவுடன் ஒருவர் கைது – சிலாபம் பிரிவு போதைப்பொருள் தடுப்பு பிரிவு***

*2026.06.14 நண்பகல், தங்கொட்டுவ பொலிஸ் பிரிவுக்குட்பட்ட மத்திய கோனவில் பகுதியில், சிலாபம் பிரிவு போதைப்பொருள் தடுப்பு பிரிவு அதிகாரிகள் மேற்கொண்ட சோதனையில், சட்டவிரோத மதுபான உற்பத்திக்குப் பயன்படுத்தப்படும் 1,215 லீற்றர் கோடா (06 பீப்பாய்கள்) உடன் ஒருவர் கைது செய்யப்பட்டு தங்கொட்டுவ பொலிஸ் நிலையத்திற்கு ஒப்படைக்கப்பட்டுள்ளார்.*

*கைது செய்யப்பட்டவர் 46 வயதுடைய மத்திய கோனவில் பகுதியைச் சேர்ந்தவர்.*

*மேலதிக விசாரணைகளை தங்கொட்டுவ பொலிஸார் மேற்கொண்டு வருகின்றனர்.*

***பொலிஸ் ஊடகப் பிரிவு***